# 19 පරදාල ආලය නොකරව

මිනිසා ආත්මයකින් හා ශරීරයකින් යුක්ත වූ මැවිල්ලකි. එම නිසා මාංශය හා ආත්මය නිරන්තර අරගලයක යෙදෙයි. මෙම කැරලි ගැසීම මිනිසාට පාපයෙන් උරුම වූ දෙයකි. පාපයෙන් මිදීමට ශුද්ධාත්ම වරප්‍රසාද හා බලය අපට අවශ්‍ය ය.

අදහසක් හෝ කල්පනාවක් හෝ සිතේ පහළ වූ පමණින් එය පාපයක් නොවේ. අකමැත්තෙන් එවැන්නක් සිතේ රැඳී තිබුණත් එයින් පාපයක් සිදු නොවේ. අදහසක් හෝ කල්පනාවක් හෝ පාපයක් වන්නේ එය ඕනෑ කමින් පමා කොට එයින් අස්වාදයක් ලබා ගන්නට උත්සාහ කළ විට ය.

> පිරිසිදුකම පවත්වා ගැනීම සඳහා නිහතමානි හැසිරීම අත්‍යවශ්‍ය ය. එය හැඟීම් පාලනය කර ගැනීමේ ගුණාංගයකි. නිහතමානිකම හා සරල තැන්පත්භාවය ඇති අයෙකු සියලු උපද්‍රවවලින් සුරකියි.
>
> (ක.ස.ධ 2521)

පිවිතුරු සිතුවිලිවලින් හෙබි මිනිසා සමාජයට විශාල මෙහෙවරක් කරයි. දෙවියන් වහන්සේගේ හඬට සවන් දෙන පුද්ගලයා තුළ පිරිසිදු චේතනා ගොඩනැගෙයි. පසුතැවීම මඟින් අපවිත්‍ර සිතුවිලි නැතිකර ගත හැකි ය. දේව ආදරය මඟින් අපගේ ආකල්ප පිවිතුරු කර ගෙන මිනිස් බවේ අභිමානය සවිමත් කිරීමට කටයුතු කළ යුතු ය.

> නුඹේ අසල්වැසියාගේ භාර්යාවට ඇලුම් නොකරව.
>
> (නික්මයාම 20:17)

කාම තෘෂ්ණාව මිනිස් ආශාවක් සැටියට හැඳින්විය හැකි ය. විවාහ වූ අය සමග අනියම් ප්‍රේම සබඳතා පවත්වා ගෙන යාම නවවන පනතට විරුද්ධ පාපයකි.

නවවන පනතින් අපට උපදෙස් දෙන්නේ විවාහ ජීවිතය තුළ රැක ගත යුතු පිවිතිරියාවට විරුද්ධ සියලු ම ක්‍රියාවන් හා කල්පනාවන්ගෙන් වැළකෙන ලෙස ය.

දාවිත් රජතුමා උරියාගේ බිරිඳ වූ බැත්-ෂෙබා සමග අනියම් සබඳතාවක් ගොඩනගා ගනිමින් පරදර ආලය කළේ ය. එය දෙවියන් වහන්සේට අප්‍රසන්න ක්‍රියාවක් වූ බැවින් ඔහුට දඬුවම් හිමි විය. හෙරොද් ඇන්ටිපස් තම සහෝදරයාගේ බිරිඳ විවාහ කර ගෙන මෙම පාපය ම කළේ ය. එම වරද පෙන්වා දීමට ස්නාවක ජොහන් තුමා කටයුතු කළේ ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

**පිවිතුරු දිවියක් ගත කිරීමට අපි**

- අන් අයට ගරු කරමු
- ඔවුන්ගේ අයිතිවාසිකම් සුරකිමු
- අවංක සිතින් තම අසල් වැසියන්ට සංවේදී වෙමු
- පිරිසිදු ජීවිතයක් ගත කරමු
- දෙවිඳුන්ට ප්‍රසන්න දේ පමණක් කරමු
- අපගේ ශරීර ශුද්ධාත්ම මන්දිර මෙන් පවත්වා ගනිමු

> පරදාර සේවනය කරන්නා අනුවණයෙකි. ඔහු තම ජීවිතය නාස්තිකර ගන්නෙකි.
>
> (හිතෝපදේශය 6:32)

ව්‍රත ශුද්ධිය රැක ගැනීම සඳහා දේව රැකවරණය පතා යැදීම කළ යුත්තකි. තම සිත දමනය කර ගැනීමට පුරුදු පුහුණු විය යුතු ය. දේව පනත් ආරක්ෂා කර ගනිමින් එකිනෙකාට ගෞරව කරමින් යහපත් දිවි පෙවෙතක් ගත කිරීමට දායක වෙමු.

## ක්‍රියාකාරකම

1. පිවිතුරු දිවියක් ගත කිරීමට ඔබට කළ හැකි දේවල් **තුනක්** ලියන්න.
2. සමාජයේ පිවිතුරු බව වර්ධනය කිරීමට යෝජනා **තුනක්** ඉදිරිපත් කරන්න.

**ජීවිතයට බිඳක්**

***දෙවිඳුනි; මා තුළ නිර්මල පිවිතුරු සිතක් ඇති කළ මැනව.***



නොමිලේ බෙදාහැරීම සඳහා ය.